# සභ්‍යත්ව රාජ්‍යයක් වෙතට...

මනස්කාන්ත හිරු රැසින් නැහැවෙන නිල්වන් ඉන්දියන් සයුරේ පිහිටි ශ්‍රී ලංකාව යැයි වර්තමානයේ හැඳින්වෙන, එහෙත් පැරණි කල සිංහලේ, නම් වූ දේශය මනෝරම්‍ය දූපතකි. එය ස්වභාව ධර්මයේ පොහොසත් සත්කාරයන්ගෙන් අනූන දායාදයන් බොහොමයක් උරුම කොට ගත්තකි. වර්ග කිලෝමීටර් හැටපන්දාහක් තරම් විශාල වත්මන් ශ්‍රී ලංකාව ප්‍රමාණයෙන් බෙල්ජියම හා නෙදර්ලන්තය තරම් විශාල ය. විශාලත්වය අතින් එය ලෝකයේ එකසිය විසිඑක් (121) වැනි තැනට විශාල රට ය. ලංකාවට වඩා කුඩා රටවල් සියයක් තරම් ඇත. ශ්‍රී ලංකාව ජන ඝනත්වයෙන් පනස් අට (58) වැනි ස්ථානයේ පසුවෙයි. දළ දේශීය නිෂ්පාදනය අතින් හැට හය (66) වැනි ස්ථානයේ පසුවෙයි. ඒක පුද්ගල ආදායම අතින් සිටින්නේ එකසිය හතර (104) වැනි ස්ථානයේ ය. අවුරුදු පහළොවට වැඩි තෘතීයික අධ්‍යාපනය ලැබූවන් අතින් පනස් නමවැනි (59) ස්ථානයේ සිටියි. ලංකාව පෘථිවියේ පිහිටීම අතින් ද ඉතා වැදගත් තැනක පිහිටා ඇත. ඉතා ඈත කාලයක පවා එනම් ක්‍රිස්තු පූර්ව සමයෙහි පවා රෝමය හා බයිසන්තියම සමගත් පෙරදිග චීනය සමගත් පෙරදිග හා අපරදිග සියලු ශිෂ්ටාචාර සමගත් ගනුදෙනු කොට තිබේ. මේ පුණ්‍ය භූමිය ග්‍රීකයන්ට තැප්‍රොබේන් විය. අරාබීන්ට සෙරන්ඩිබ් විය. ඉන්දියානුවන්ට ලංකා විය. පෘතුගීසින්ට සෙයිලාවෝ විය. ලන්දේසින්ට සෙයිලාන් විය. ඉංග්‍රීසින්ට සිලෝන් විය. ඒ අනුව සිංහලේ විශේෂිත ජාතියක් හා විස්මිත ශිෂ්ටාචාරයකට උරුමකම් කියනා රටකි.

එහෙත් ඒ විශ්මිත ශිෂ්ටාචාරයට අද කුමක් වී ද? එය සොයා ගත නොහැකි ලෙස විකෘති කර තිබේ. ඉන්දු ගංගා - මායා - ඉන්කා - ඊජිප්තු - (යුප්‍රටීස්) බැබිලන් - මෙසපොතේමියානු ශිෂ්ටාචාර මෙන් සම්පූර්ණ ලෙස මිය නොගිය නිසා මෙය පාගා පොඩි කර දමා ඇතත් අපගේ ශිෂ්ටාචාරය යළි ගොඩ නගා මිස ජාතියක් හැටියට අපට නැගී සිටිය නොහැක. බටහිර ලෝකය විසින් අපේ ජනතාව තුළ රැඳි චිරස්ථායී ජීවන පැවැත්ම ද එම චිරස්ථායී ජීවන පැවැත්ම තුළ රැඳි අපගේ ජීවන දර්ශනය ද මුලිනුපුටා දමා තිබේ. එය යළි ගොඩනැගිය යුතු ය. යුගයේ අභිප්‍රාය වචනයට පරිවර්තනය කළ හා එය ක්‍රියාවට නැගූ පණ්ඩුකාභය, මහ පැරකුම්බා, පළමුවැනි විජයබා, ධාතුසේන වැනි දූරදර්ශී පාලකයකු ගොඩනැගීමත් එවන් පාලකයකු නිර්මාණය කිරීම සඳහා ජාතිය කැඳවාගෙන යන මාර්ගය ජනතාව හරි හැටි නොදන්නා බවත් එකී ජනතාව, තමා කැඳවාගෙන යන ජාතියේ මළගමට වැටී ඇති මාවතින් ඉවත් කොට ගැනීමත් අද දවසේ අපගේ කාර්යභාරය බව අප තේරුම් ගත යුතු ව තිබේ. යටත් විජිතයට අවශ්‍ය උගතුන් පමණක් බිහි කර ගැනීමේ එක ම පරමාර්ථයෙන් මැකෝලිගේ උපායමාර්ගයකට ආරම්භ

කළ ලංකාවේ අධ්‍යාපනයෙන් අපට එවැන්නක් බලාපොරොත්තු විය නොහැකි ය. මෙම විනාශකාරි මාවතින් ජාතිය ගලවා ගැනීම සඳහා පොදු හඬක් නැගීම අද දවසේ යුතුකම බව අපි විශ්වාස කරමු.

ඉතිහාසය දෙස ඉතා පරීක්ෂාවෙන් බලන විට අපට පෙනී යන්නේ යුරෝපීය යටත්විජිත පාලකයන් පෙරදිග ලෝකයට දී ඇති උන්ගේ අධ්‍යාපනයෙන් අප ව මේ වන විට වහලුන් කොට ඇති බවයි. අද අපේ රටේ පවතින දුප්පත්කම හා එය නඩත්තු කිරීම මේ යටත්විජිතවාදය සමග සහසම්බන්ධ වෙයි. අද අපි කවුරුත් දන්නා පරිදි ඔවුන් ගොඩනගා ගොස් ඇති ආර්ථික හා දේශපාලනතන්ත්‍රය උන්ට උවමනා ලෙස නඩත්තු කිරීම සඳහා උන් ම විවිධ එන්ජීඕ නඩයන් සහ ආර්ථික ඝාතකයන් මගින් තවමත් අපේ රටේ ඉරණම මෙහෙයවමින් සිටිති. රට හැසිරවීම සඳහා දේශපාලන හා ආර්ථික මර්මස්ථානවල ප්‍රධාන පෙළේ යටත්විජිත නිලධාරින් තවමත් ඇත. සංවර්ධනය සඳහා ඔවුන් අනුගමනය කරනු ලබන තාක්ෂණයත් ඒ සමගාමී ජීවිතයත් දෙක ම මජර පාරිභෝගිකවාදය තුළ බෞතීස්ම කළ දර්ශනයක් මිස එය නිවැරදි අපේ ම වූ ජීවන දර්ශනයක් නොවේ.

අපේ පුරාණ සභ්‍යත්වයේ ජීවන දර්ශනය ගොඩ නැගී තිබුණේ බිසෝ කොටුව, පෙතිපිළිම, මහා දාගැබ් නිරූපණය කළ තාක්ෂණය හා සමගාමී ජීවන දර්ශනයකි. එම දර්ශනය වසර දෙදහසකට වැඩි කාලයක් තිස්සේ පොළොන්නරුව අතහැර යන තෙක් ම රඳවා ගත්තා පමණක් නොව ලෝකයේ පොහොසත් හා ධනවත් ම රට හැටියට පවත්වා ගන්නට අපි එදා සමත් ව සිටියෙමු. මැකෝලිගේ යටත්විජිත අධ්‍යාපනයෙන් ඒ සභ්‍ය අධ්‍යාපනය ගලවා ඉවත් කොට ඇත. අපි වැරදි මාවතක දිගට ම ගමන් කරමින් සිටිමු. අපි තව ම හිඟන්නන් මෙන් හතර අතට හිඟා කකා කරවටක් ණය බරිත ව ඇත්තේ මේ චින්තනමය වහල්කමෙන් නිදහස් වීමට බැරි වීම නිසා ය. මින් නිදහස් වීමට නම් තවමත් නොමැරී ඇති අපගේ අතීත සභ්‍යත්ව විඥානය, අතීත තාක්ෂණය, අතීත දේශපාලන හා ආර්ථික ජීවන දර්ශනය නැවත පණ ගන්වා එදෙසට පියමං කිරීමේ වැදගත්කම සාකච්ඡාවට ගත යුතු ය. කළ යුත්තේ අන්ධයින් ලෙස පසුපසින් ගැටීම නොවේ. අපට මේ අන්ධභාවය දිගින් දිගට ම එන්නේ යුරෝපියානු සංවර්ධන මිත්‍යාව පසුපස ගමන් කිරීම නිසා ය. 1948 ඩොමීනියන් තත්වය උදා වීමෙන් පසුවත් 1956 ජනතා ජයග්‍රහණය හා බමුණු කුලය බිඳවැටීම ලෙස හැඳින්වූ මහා පෙරළියෙන් පසුවත් 1970 දී ලද ජනතා ජයග්‍රහණය යැයි විරුදාව ලත් පෙරළියෙන් පසුවත් 1977 න් පසු උදා වූ ඉතා ම නරක යුරෝපියානු සංවර්ධිත මිථ්‍යාව වැළඳගත් නිදහස් වෙළඳ හා ආර්ථික ප්‍රතිපත්තිය තුළත්

අපගේ අන්ධභාවය අද දක්වා ම නොනැසී පැවතී ඇත. ආර්ථික හා දේශපාලනික මර්මස්ථාන හසුරුවන සුදු නොවන සුදු මහත්වරුන් විසින් අපට (ජාතික දේහයට) අපේ චින්තනය තුළට මේ අන්ධභාවය හොඳින් කාවද්දා තිබේ. අපි උන්ට හොඳ අස්වැන්නක් ලබා දී උන්ගේ ආරක්ෂකයන් හා වහලුන් ලෙස කටයුතු කරමු. වහල් ව සිටීමේ දීන කමත් නිවටකමත් නින්දාවත් අපේ ලෙය තුළට කා වැදී යන්නට නොව එය අභිමානයක් ලෙස සුරකින්නට මැකෝලිගේ අධ්‍යාපනයෙන් අපට උගන්වා තිබේ.

අපි අපේ හිඟුරාන හා කන්තලේ සීනි කර්මාන්ත ශාලා දෙකත් ඇඹිලිපිටියේ හා වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලා දෙකත් ඕරුවල වානේ කර්මාන්ත ශාලාවත් පුත්තලමේ සිමෙන්ති නිෂ්පාදනයත් කැලණියේ ටයර් හැදීමත් අතහැර ලාබයට ඒවා ගෙන්වා බෙදා හරින්නට තීන්දු කළෙමු. අද අපේ විරැකියාව හා දිළිඳුකම පිටුපස මේ අදූරදර්ශී දේශපාලන ක්‍රියාවලිය පවතින බව වර්තමාන දේශපාලන නායකත්වයන්ට වැටහෙන්නේ නැත. යක්කල අපි අපේ ලෝහභාණ්ඩ නිෂ්පාදනය ආරම්භ කළේ, අපේ ඉතා ඉහළ වානේ නිෂ්පාදනයක් පැවැති අවධිය පිළිබඳ මොන ම හෝ පර්යේෂණයක්වත් නැති ව ය. වෙරිංන්ටන් සමාගමේ කිඹුලා උදැල්ල අනුකරණය කිරීම, ලංකා ලෝහ භාණ්ඩ සංස්ථාවේ මුඛ්‍ය පරමාර්ථය කර ගැනීමට තරම් දීන අනුකාරක සිතිවිල්ලක් අපට විය. අද ජාතිය ඉබාගාතේ යන වල්මත් වූ ජාතියක් බවට පත්වීමට එක් හේතුවක් නම් අප මේ සභ්‍යත්ව විඥානයෙන් තොර දීන අනුකාරකයන් පිරිසක් බවට වීම යි. අපේ දරුවනුත් මේ මග ම යා යුතු ද? නැතිනම් නව සංවර්ධන මාවතක් සඳහා දේශපාලන සංවාදයක් නිර්මාණය කර ගනිමු ද? මෙවර "ජාතික ජනතා පක්ෂය", "පරපුරක උරුමය", "හෙළජන සන්ධානය" පාර්ලිමේන්තු මැතිවරණයට තරග වදින්නේ නව සංවර්ධන මාවතක් සකස් කර ගැනීම සඳහා පාර්ලිමේන්තුව වේදිකාවක් කර ගෙන රට ජයග්‍රහණය කරා ගෙන යාමට ය. තවමත් අපේ රටේ ක්‍රියාත්මක රෝම ලන්දේසි නීතියත් යුරෝපා සංවර්ධන ආර්ථික මොඩලයත් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායත් වෙනුවට අපේ ම වූ පාලන ආකෘතීන් සඳහා විදග්ධ සමාජයට නිවැරදි සාකච්ඡාවක් මුදා හැරීමට ය.

යුරෝපා විශ්වවිද්‍යාල මුල්කොටගෙන වර්තමානයේ මුළු මහත් මානව සංහතිය මත බලහත්කාරයෙන් පටවා ඇති දැනුම් හා සංකල්ප වෙනුවට ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකානු කලාපයේ ජනයාගේ පාරම්පරික චින්තනයට හා ජීවිතයට අවශ්‍ය නව "ප්‍රවාද" ගොඩනැගීමට ඇති හැකියාව වටහාගෙන ඊට උචිත සැලැස්මක් ඉදිරිපත් කිරීමට "ජාතික ජනතා පක්ෂය" සහිත "පරපුරක උරුමය" සහ "හෙළජන

සන්ධානය" බලාපොරොත්තු වෙයි. වර්තමානයේ අපේ රටත් පොදුවේ ලෝකයේ විශාල පංගුවකටත් අත් විඳීමට සිදු ව ඇති අභාග්‍යයේ තරම කොරෝනා වයිරස් උවදුරත් සමග අපි අත්වින්දෙමු. බටහිර වෛද්‍ය විද්‍යාවේ සිද්ධාන්ත මත පමණක් ඊට ප්‍රතිකාර කිරීමට ඉඩ දීම ලංකාවේ සාම්ප්‍රදායික සිංහල වෙදකමට හා රජය විසින් මහජන මුදලින් නඩත්තු කරන ආයුර්වේද වෛද්‍ය සභාවට ඊට ඉඩප්‍රස්ථාව නොදීමට තරම් අපේ දේශපාලන නායකත්වය හා නිලධාරිතන්ත්‍රය බටහිර ගැති වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2007 බීජිං සමුළුවේ දී තීරණය කර ගත් පරිදි වසංගත රෝග තත්වයන්වල දී ලොව පුරා විවිධ දේශයන්හි පාවිච්චි කළ සාම්ප්‍රදායික රෝග පාලන හා ඖෂධ විධීන් ව්‍යවහාර කිරීමට ඉඩකඩ විවර කිරීම සඳහා දෙන ලද අවසර පත්‍රය ද උල්ලංඝනය කිරීමකි. මේ අන්ධභාවය අපේ උසස් නිලධාරීන්ට හා දේශපාලන නායකයන්ට ගොඩනගා ඇත්තේ යුරෝපා සංවර්ධන පසුබිම ඔවුන්ගේ ලේ නහර තුළට කාවැද්දීමෙනි. අධිරාජ්‍යවාදී පාලනය පැවති වකවානුවෙන් පසුව නව යටත්විජිත පාලන සමයේදීත් අදත් ක්‍රියාවට නැගෙන මෙම යුරෝපා කේන්ද්‍රීය පාලනය මුළු මහත් පොළෝතලය ම වසා පැතිර පැවතීම ඊට හේතුව යි. අපේ දරු පරපුරත් ඊට යටත් ව උන්ගේ යදමින් බැඳී පසු ගමන් යා යුතු ද ?

ඇත්තවශයෙන් ම අප අද මුහුණ දෙන ආර්ථික, දේශපාලන, සමාජ හා සංස්කෘතික ගැටලුවල නිර්මාපකයන් වන්නේ ඉංග්‍රීසි යටත්විජිතවාදය යි. ඊට දීර්ඝ ඉතිහාසයක් ඇත. මේ පරිහානියට මූලික කරුණු දෙකක් බලපා තිබේ. පළමුවැන්න ආර්ථික කාරණාවයි. දෙවැන්න මානසික කාරණාවක් වෙයි. ඇත්ත වශයෙන් ම අපේ ආර්ථික උපාය මාර්ගය යටත්විජිත උපාය මාර්ගයෙන් ඉවත්කොට ගෙන නැත. පොළොන්නරුව අතහැර එන්නට පෙර වසර දෙදහසකට වැඩි කාලයක් පැවතියේ මේ පොළොවට උචිත ආර්ථික දේශපාලන සැලැස්මකි. එය සැතපුමකට අඟලක හෝ අඟල් භාගයක ආනතියකට ජලය ගෙන ගිය යෝධ ඇලවල් හා විශාල වැව්වලින් ස්වයංපෝෂිත කළ අපේ වානේ, අපේ උක් හකුරු, කිතුල් පැණි, රෙදිපිළි, අපේ මැණික් ඇතුළු අපනයන කර්මාන්තයන් හා ආහාර සුරක්ෂිත කර ගත් දර්ශනයක් ඇතුළත් අපේ භූමියට ගැලපෙන ආර්ථික සංවර්ධන මාර්ගයකි. ඊට අනුගත ව ගොඩනැගුණු සාමාජීය මානසික පරිසරය ද ශිෂ්ටාචාරයේ මූලයන් සමග සමපාත ව ආර්ථික හා දේශපාලන දර්ශනයට සවිමත් ශක්තියක් එක් කළ මනෝභාවයකි. අද අප හඹා යන යුරෝපීය සංවර්ධන මිථ්‍යාව එබන්දක් නොවේ.

යුරෝපීය සංවර්ධන සැලැස්ම යනු බටහිර පාලකයන් හා එහි ආර්ථික න්‍යායාචාර්යවරුන් විසින් ම ලෝකයේ අනෙක් රටවල

(ඔවුන්ගේ වචනයෙන් පවසතොත් ඌන සංවර්ධිත හා නොදියුණු රටවලට) බොරුවෙන් පෙන්වා දෙන සංවර්ධන මාවතකි. මේ මායාව සංවර්ධිත රටවලින් ගලවා ඉවත් කිරීමට කොරෝනා වයිරස්වලට නැත්නම් ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ වචනයෙන් කිවතොත් චීන වයිරස්වලට හැකියාව ලැබුණි. චීනය ඇතුළු බොහෝ ආසියාතික රටවල ජනයා සිය සංස්කෘතියේ බලමහිමයෙන් (රජයේ අණ පිළිපැදීම නිසා) මේ උවදුරින් ගැලවීමට තමතමන්ගේ රාජ්‍ය පාලකයන්ට හා වයිරස් පාලනයට සංයමයකින් සහයෝගය පළ කළ අතර බටහිර අශීලාචාර සංස්කෘතීන් සහිත ජනයා එසේ නොවීමෙන් ව්‍යසනය ළඟා කර ගත් ආකාරය අපි පසුගිය කාලයේ දුටුවෙමු. විනයගරුක හා නීතිගරුක වූ පොදු ශ්‍රී ලාංකිකයන්ගේ එබඳු ශිෂ්ට හැසිරීමක් පැවතිය ද බටහිර දර්ශනයෙන් ඔද්දල් වූ හා උන් පසුපස යන අසංස්කෘතික ඉතා සුළු ජන කණ්ඩායම් කීපයක්, එසේ නොවී ගම්මාන පිටින් උවදුර කැන්දාගත් ආකාරයත් අපි දුටුවෙමු. මූලික කාර්යය වන්නේ යුරෝපයේ භෞතික දියුණුවෙන් වහනය වන මායාකාරී දෘශ්‍යපථයට මුළා වූ අපේ නිලධාරීන්ගෙන් හා නායක මට්ටමේ ප්‍රභූන් වෙතින් මේ සත්‍යය මතු කර ගැනීමයි. අප මාතෘභූමිය මෙම උවදුරින් ගලවා ගැනීම සඳහා බටහිර කාණුවෙන් ම, එනම් එම ආකෘතියේ පාර්ලිමේන්තු ක්‍රමය තුළින් ම වෙනත් බටයක් දමා පිරිසිදු ජලය (මතවාදය) ගෙන යාමට කටයුතු කිරීමයි. අප උත්සාහ දරමින් සිටින්නේ පාර්ලිමේන්තුව තුළට නව මතවාදයක් ඇතුළු කිරීමටයි. සමස්ත ලාංකේය ජනයා වෙත එම මතවාදය ඉක්මනින් හා නිවැරදි ව ගෙන යාමටයි. යටත්විජිතවාදීන්ගේ පරම අදහස වූ යුරෝපා පරිපාලනය හා සංවර්ධන මාවත ලෝකය පුරා බලාරෝපනය කිරීම, යල් පැන ගිය එකක් බව ඔවුන් තව ම හරිහැටි හඳුනාගෙන නැත.

දෙවන යුරෝපා යුද්ධය අවසානයේ දී පැවති මහා මැතිවරණයෙන් එංගලන්තයේ කම්කරු පක්ෂයේ නායකයා වූ ක්ලෙමන්ට් ඇට්ලිසාමි බලය ලබා ඒ වන විට ඔවුනට හිසරදයක් ව පැවැති යටත්විජිත පාලනය නීති මගින් අකුලා දැමීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට අධිරාජ්‍ය විසුරුවා හැරීමේ පනත ඉදිරිපත් කළ අවස්ථාවේ වින්සන් චර්චිල් කියා සිටියේ ලෝකයට ශිෂ්ටාචාරය ලබා දුන්නේ ඔවුන් බවයි. 1818 දීත් 1848 දීත් 1915 දීත් ගෙන්දගම් උණ්ඩවලින් ඔවුන්ගේ ලෙළදුන් බයිනෙත්තු තුඩුවලින් අපට ශිෂ්ටාචාරය ඉගැන් වූ හැටි මතක ය. තවත් අවස්ථාවක දී චර්චිල් කියා සිටියේ පිදුරු ගොඩේ ලැග්ගාට බල්ලාට එය හිමි නොවන බවයි. ඇමරිකාවේ රතු ඉන්දියානුවාට, අප්‍රිකාවේ කළු මිනිසාට ඕස්ට්‍රේලියාවේ ඇබොරිජියන්වරයාට නවසීලන්තයේ මාඕරිවරයාට(මෞරි) අත් කර දුන් ඉරණම වූයේ, පිදුරු ගොඩේ බල්ලාට අත් කර දුන් ඉරණම ම ය. එම

ඉරණමට අප ව ගොදුරු කිරීමට ඔවුන් කීපවරක් උත්සාහ කළ ද වඩාත් ලාභදායී ලෙස ඒ වෙනුවට මැකෝලිගේ අධ්‍යාපනය මගින් මනසින් හා ක්‍රියාකාරකම්වලින් බටහිර ගැති ජනතාවක් මේ බිමේ බිහි කළ බව ද මේ මොහොතේ සිහිපත් කරමු. එය ඉහත කී යටත් කිරීමටත් වඩා දීර්ඝකාලීන වාසි ඇති උන්ට ලාභදායි හා ඵලදායි ස්වයං යටත් වීමක් ලෙස ඔවුන් දුටුවා විය යුතු ය.

ලංකාව සිය ඓතිහාසික ගමන් මගේ අවසාන අදියර කරා කෙමෙන් කෙමෙන් ළඟා කරවමින් සිටී. ඉතිහාසයේ අවසන් පාවාදීම වෙත ලංකාව කැන්දාගෙන විත් තිබේ. චීනය සමග එක් ව මුහුදු හා නාවුක ගමනාගමනයේ කේන්ද්‍රීය හැරවුමක් කරා ළඟා වූ හම්බන්තොට වරායෙන් හා කොළඹ පෝට්සිටි ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිචාර හා ඊට සාපේක්ෂ ව බටහිර රටවල් ගොඩනගන නව මූලෝපායයන් හඳුනා ගැනීමත් මේ මොහොතේ අත්‍යවශ්‍ය වේ. එදා රට අස්ථාවර කිරීමට එල්. ටී. ටී. ඊ. සංවිධානය යොදා ගත් ආකාරයට ම අද වන විට වෙනත් මූලධර්මවාදී සංවිධාන හා පුද්ගලයින් භාවිතාවේ යොදවා ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය හමුවේ යුධ අපරාධ ගොනු කිරීමත් එහි සම අනුග්‍රාහකත්වය ලංකාවට දීමත් අපේ විදේශ ප්‍රතිපත්තිය පාලිත, පාලක දෙපක්ෂයේ අවබෝධයේ ක්ෂේත්‍රඵලයේ ප්‍රමාණයන් විදහා දක්වයි. ලංකාව නිර්දය සත්‍යය කරා ගමන් කළ යුතු අවධිමය සන්ධිස්ථානයක් කරා පැමිණ තිබේ. අපේ පැරණිවූත් නවීනවූත් අත්තනෝමතික පාලකයන්ගෙන් උරුම වූ හා විනාශකාරී ශුද්ධ ස්ථාන ලෙස ඔවුන් හඳුන්වන කූඨාගාර සියල්ල (ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය) බිඳහෙළා බිමට සමතලා කොට ඒ නටබුන් මත සභ්‍යත්වයේ උරුමය වහනය වන ස්වදේශික දැනුම් මූලාශ්‍රයයන් වෙත ගමන් කළ යුතු කාලය පැමිණ තිබේ. බටහිර ආධිපත්‍යය විසින් අප වෙත තීන්දු කර සිටින ස්ථානයෙන් හා බ්‍රිතාන්‍ය නව යටත්විජිත ආධිපත්‍යයෙන් මිදීමට මේ අවසාන අවස්ථාව අපි යොදා ගනිමු.

ශ්‍රී ලංකාවේ අතීත සම්ප්‍රදායයන් විසින් ගොඩනගා ඇති පාරම්පරික ඥානය පිළිබඳ අප සතු වූ දැනුමත් විශ්ව මානව සංස්කෘතියට එය කර තිබූ බලපෑමත් මේ මොහොතේ අපගේ දැනුම් පද්ධතිය තුළට ගැනීම අප වෙළාගෙන ඇති ව්‍යසනයෙන් මිදීමේ මගක් හැටියට තේරුම් ගැනීම වැදගත් වෙයි. මේ බිමේ අයිතිකරුවන් වන මිනිස් හා සත්ව ප්‍රජාව අතින් එහි උරුමය පැහැර ගන්නා ලද්දේ 1833 සැප්තැම්බර් 01 දා බ්‍රිතාන්‍ය රාජකීය ආඥාවකිනි. අප විසින් විශ්ව මානව ප්‍රජාවට දායාද කළ පාරිසරික නීති, ඉංග්‍රීසීන් විසින් ගලවා ඉවත් කරන්නට යෙදුණේ ඉන් පසුව ය. තිරසාර සංවර්ධනය යන උපකල්පනය අප නිතර කථා කරතත්

වසර දහස් ගණනක් තුළ අපේ උදාර පරම්පරාවල සාරවත් අත්දැකීම් හා අන්තර් ඥානයන්ගෙන් පොහොසත් ව පැවැති පරිසරය හා සංවර්ධනය එකට ගමන් ගත් ඥානය, සංවර්ධනයත් පාරිසරික ආරක්ෂාවත් එක සේ වෙන් කළ නොහැකි මූල ධර්මයක් කොට ගත්තේය.

පරිසරයේ නියමයන් සමග වසර දහස් ගණනක් තිස්සේ අචල සම්බන්ධතාවක් පවත්වාගෙන යමින් ම සිය කටයුතු කරගෙන යාමට මිනිසාට ඥාන ශක්තිය ලබා දුන් සභ්‍යත්වයේ උරුමයන් වැළඳ ගැනීම, මිනිසාට තවදුරටත් මේ පොළෝතලය මත නොනැසී ජීවත් වීමට අත්‍යවශ්‍ය වෙයි. මේ බිමේ අයිතිකරුවන් සත්ව හා මිනිස් ප්‍රජාව වන අතර ඔවුනට උරුම බිම 1833 සැප්තැම්බර් 01 දා රාජකීය ආඥාවක් මගින් කපා බිම හෙළන්නට වූ අතර අද දක්වා ම එම ඝාතනය සිදු වෙමින් පවතී. ව්‍යවස්ථාදායකය හා විධායකය ලෙස ආයතන දෙකක් පිහිටු විණි. ජනවර්ග පදනමින් ඊට නියෝජිතයන් පත් කෙරිණි. ලංකාව පළාත් පහකට බෙදිණි. පසුව එය නවයක් දක්වා වැඩි කෙරිණි. පළමු ව ජාතිකත්ව හැටියට බෙදූ අතර පසු ව එය භූමීන් අනුව බෙදිණි. වැසි වනාන්තර පිරි මධ්‍ය කඳුකරය කපා තේ වගාව සඳහා යොදා ගැනිණි. චිරාත් කාලයක් අප විසින් පවත්වා ගෙන එන ලද පාරිසරික නීති උන්මූලනය කරන ලදී.

භූමියෙහි සම්පත්වල භාරකාරිත්වය පිළිබඳ මූලධර්මය, පරම්පරා අතර අයිතිවාසිකම් පිළිබඳ මූලධර්මය සහ සංවර්ධනය හා පරිසර සංරක්ෂණය අත්වැල් බැඳගෙන යමක් කළ යුතුය යන මූලධර්මය ද ඊට ම අයත් ශක්තියකින් යුක්ත වූ ප්‍රජාවෙහි සුබසාධනය සමග පූර්ණ ලෙස බැඳී පවතින්නා වූ භූමියට ගෞරව කළ යුතු ය යන මූලධර්මය ද මිනිසුන් භූමිය භාවිත කරන විට භූමිය පෙර තිබූ තත්වයට ම පැවතීමට ඉඩ හසර තැබිය යුතුය යන මූලධර්මය ද සෑම ශාකයකට හා සත්වයෙකුට ම පරිසරයෙහි ඊට උචිත තැනක් ඇති බැවින් එය ආරක්ෂා කර තැබිය යුතුය යන මූලධර්මය ද පරිසරයෙහි නිර්මලතාව හා ඒකාබද්ධතාව ආරක්ෂා කිරීමේ මූලධර්මය ද ස්වාභාවික සම්පත්වලට අයිතිය ඇත්තේ පෞද්ගලික ව නොව සාමූහික ව බව කියැවෙන මූලධර්මය ද ශාක හා සත්ව පැවැත්මේ ප්‍රතිජනන හැකියාවන් ආරක්ෂා කිරීමේ මූල ධර්මය ද ස්වාභාවික දෙය උපරිම ප්‍රයෝජනය පිණිස යොදා ගත යුතුය යන මූලධර්මය ද සිඳ බිඳ ලන ලදි. මේ පරිසර විනාශකාරී ප්‍රතිපත්තිය නිසා වර්තමානයෙහි ගංවතුර ද සෝදා පාළුව ද නියගය ද මුහුදු ඛාදනය ද අපට උරුම කොට ඇත. ඔවුන් අනුගමනය කළ කෘෂි හා වාරි ප්‍රතිපත්තිය ද විනාශකාරී එකක් විය. අපේ ගොවිතැන වෙනුවට කෘෂිකර්මාන්තයක් ද අපේ ස්වාභාවික ජල සැපයුම වෙනුවට ගංගා හරස් කොට ඉදිකළ වාරි ප්‍රතිපත්තියක් ද අපට උරුම කර දීමෙන්, බටහිර දැනුම හා තාක්ෂණය

පසුපස ගමන් කරනා දීන අනුකාරක ජනතාවක් හා පාලක කණ්ඩායමක් මේ බිමේ නිර්මාණය වී තිබේ.

මේ ගමන් මගින් අප මිදීමට නම් හා බටහිර මිථ්‍යා සංවර්ධනයෙන් මිදීමට නම් සැබෑ භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනයක් වෙත අප ගමන් කරමු නම් ඉතාමත් දියුණු සැලැස්මකට 1833 දී ක්‍රියාවට නැගුණු බටහිර මූලෝපායයන් ගලවා ඉවත් කර ජාතික මූලෝපායයන්වලින් සැදි නිවැරදි මූලෝපායික මගකට ලංකාව රැගෙන ආ යුතු ව ඇත. ඒ සඳහා වන ප්‍රතිපත්ති ඇතුළත් දේශපාලන යෝජනාවලියක් අපි ඔබට ඉදිරිපත් කරමු. එය යථාර්ථයක් කිරීමට අපි දිව්රා පොරොන්දු වෙමු. දිව්රා ප්‍රතිඥා දෙමු.

---

# ප්‍රතිපත්ති ප්‍රකාශය

## රාජ්‍ය ව්‍යුහය

01. **ස්වභාවය**
   i. මහජන පරමාධිපත්‍යය පිළිගන්නවා ඇත. මහජන පරමාධිත්‍ය බලයෙන් සැබෑ ජාතික රාජ්‍යයක් ස්ථාපිත කෙරෙනු ඇත. පරමාධිපත්‍යය ජනතාව සතු ය. රාජ්‍යය මගින් එහි ලෞකික ස්වරූපය තහවුරු කරනු ඇත.
   ii. නූතන අභියෝග ජය ගත හැකි පොළොන්නරුව සම්ප්‍රදායේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරනු ඇත.
   iii. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හය මසකට නොඅඩු කාලයක් ඡන්දදායක දායිකාවන්ගේ සාකච්ඡාවට බඳුන් කොට ජනමත විචාරණයකින් සම්මත කර ගනු ලැබේ.
02. **සියලුම ෆෙඩරල් අංග ලක්ෂණ අහෝසි කෙරෙනු ඇත. සමානාත්මතා මූලධර්මය පවත්වාගෙන යනු ලැබේ. වාර්ගික පදනම අහෝසි කරනු ඇත.**
03. **සියලු ම රාජ්‍ය ආයතන ජනතාවට වගකියනු ඇත.**
04. **වෙස්ට්මිනිස්ටර් පක්ෂ සම්ප්‍රදාය හා පර්ලිමේන්තු සම්ප්‍රදාය අහෝසි කරනු ඇත.**
05. **වයස අවුරුදු 18 ට වැඩි සියල්ලට ම ඡන්ද බලය හිමි වන අතර ඡන්ද බලය හිමි අයට මහජන ආයතන සඳහා තේරී පත්වීමට හැකිය.**
06. **පරිපාලන ව්‍යුහය**
   i. ස්ථිර ලේකම්, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාමනිලධාරි දක්වා දිවෙන යටත්විජිත රාජ්‍ය පාලන ක්‍රමය අහෝසි කොට මහජන නියෝජිතයන් ද ඇතුළත් පරිපාලන සැලැස්මක් සකස් කරනු ඇත.
   ii. යටත්විජිත පාලකයන් ගොඩනගා ඇති පරිපාලන ප්‍රදේශ වෙන් කිරීම

නිවැරදි ලෙස සකස් කරනු ඇත.

iii. අගනුවර ලංකාවේ මධ්‍ය ප්‍රදේශයට ගෙන යනු ඇත.

iv. යටත්විජිත සමයේ සිට පැවත එන යල්පැන ගිය සියලු ම යටත් විජිත අණපනත් අහෝසි කොට (නිරෝධාන පනත වැනි) නූතන අභියෝග ජයගත හැකි පනත් හා රෙගුලාසි යළි පනවනු ලැබේ.

**07. රාජ්‍ය ආරක්ෂාව සඳහා මහජන නියෝජිතයන් ඇතුළත් රාජ්‍ය ආරක්ෂක කමිටුවක් ගොඩනගනු ලැබේ.**

**08. රටේ සියලු ම භූමිය පිළිබඳ පරම අයිතිය රජය සතු වන අතර විදේශ හා දේශීය සියලු බදු දීම් නැවත සලකා බලනු ඇත.**

**09. පසුගිය වසර 200 කාල සීමාව තුළ දී මෙරට ක්‍රියාත්මක වූ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළත් යම් ජන වර්ගයකට අගතියක් ඇති වී ඇති බවට ජන සංඛ්‍යා ලේඛන අනුව තහවුරු වන්නේ නම් එකී ජන කොටසට වූ අගතිය ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ භූමියට දැරිය හැකි ජනගහනය ගණනය කර අවශ්‍ය පියවර ගනු ඇත.**

## නීතිය

10.

i. රෝම-ලන්දේසී නීතිය අහෝසි කර සභ්‍යත්ව රාජ්‍යයක් සඳහා වන නීති පද්ධතියක් හා ජනතා අධිකරණ ක්‍රමයක් ඇති කරනු ලැබේ.

ii. පාරම්පරික දේශීය නීති රීති සම්ප්‍රදායන් සහ ඉංග්‍රීසී නීතියේ යහපත් අංග මුල් කොට පුරවැසියන් සියල්ලන්ට ම ඒකීය නීති පද්ධතියක් හඳුන්වා දෙනු ඇත.

iii. වාර්ගික හා ආගමික සිරිත් විරිත්, විනය හා සම්ප්‍රදායයන් ලෙස මිස නීති ලෙස නොසැලකේ. ජාතිකත්වය, ආගමිකත්වය ඇතුළු වාර්ගිකභාවයන් නීතිය ඉදිරියේ සමාන වනු ඇත.

iv. රජය අධිකරණයට මැදිහත්වීම මුළුමනින් ම අහෝසි කරනු ඇත.

v. තේසවලාමේ නීතිය, උඩරට විවාහ නීතිය, මුස්ලිම් විවාහ නීතිය ඇතුළු ප්‍රදේශ හා වාර්ගික නීති අහෝසි කරනු ඇත.

vi. ග්‍රාමීය, නාගරික, දිසාබද ජනතා අධිකරණයන් පිහිටුවන අතර උත්තරීතර ජනතා අධිකරණයක් සියලු අධිකරණවලට ඉහළින් පිහිටුවනු ලැබේ.

vii. මරණ දඬුවම අහෝසි කරනු ලැබේ.

viii. බන්ධනාගාරය මුළුමනින් ම විශෝධන ක්‍රියාවලියක් වනු ඇත.

ix. අධිකරණයේ භාෂාව විත්ති හා පැමිණිලිකරුවන්ගේ අභිමතය පරිදි සිදු කරනු ඇත.

## භාෂාව

11.

i. සිංහල හා දෙමළ භාෂා රාජ්‍ය භාෂා ලෙස පිළිගැනේ. ඉංග්‍රීසිය ජාත්‍යන්තර සම්බන්ධීකාරක භාෂාවක් ලෙස පමණක් භාවිත කරනු ඇත.

ii. සිංහල හා දෙමළ භාෂා රාජ්‍ය පරිපාලන හා අධිකරණ භාෂා ලෙස පිළිගනු ඇත.

iii. භාෂා භාවිතය පුද්ගල විභේදනයේ නිර්ණායකයක් නොවනු ඇත.

## සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය

12.

i. සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ උන්නතිය සඳහා රාජ්‍ය බලයක් හිමි ආයතනයක් පිහිටුවනු ඇත. දැනට ක්‍රියාත්මක වන ICTA වැනි ආයතනවලට කර්මාන්තයට මැදිහත්වීමට ඇති බලය කිසිසේත් ප්‍රමාණවත් නොවන නිසා රාජ්‍ය පරිපාලන ව්‍යූහය තුළ ක්‍රියාත්මක වන 'අධිකාරියක්' වැනි ආයතනයක් පිහිටුවනු ඇත.

ii. ICTA ස්වයංපෝෂිතභාවයක් ළඟා කර ගැනීමට සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කෙරේ.

iii. පාසල් හා විශ්වවිද්‍යාල දරුවන් සඳහා ඉතා පහසු මිලට සන්නිවේදන සහ පරිගණක පහසුකම් ලබා දෙනු ඇත.

## අධ්‍යාපනය

13.

i. අධ්‍යාපනයේ සියලු වගකීම් රජය සතු වනු ඇත.

ii. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පූර්ණ ප්‍රතිසංස්කරණයක් සිදු කරනු ඇත.

iii. පවතින විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්වදේශික දැනුම් පද්ධතියක් පිළිබඳ සක්‍රීය අධ්‍යාපනයන් සහ පර්යේෂණ ආරම්භ කරනු ඇත.

iv. පාසල් අධ්‍යාපන පද්ධතියේ විෂයයන් තුළට දේශීය දැනුම හා දේශීය ශිල්ප ක්‍රම භාවිතයන් ඇතුළත් වන සේ සියලු ම විෂය මාලාවන් දේශීය බුද්ධිමතුන්ගේ මග පෙන්වීම මත වෙනස් කරනු ඇත.

v. සියලු ම පුද්ගලික අධ්‍යාපන ආයතන ඍජු රාජ්‍ය නියාමනයකට ලක් කරනු ඇත. ඒ යටතේ දැනට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් නමින් හඳුන්වන ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදෙන පාසල් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඍජු අධීක්ෂණය යටතේ පාලනය කරනු ඇත.

vi. සියලු පාසල් දරුවන් හට සිංහල/ දෙමළ ඉගෙනීම අනිවාර්ය වනු ඇත.

vii. විභාග ක්‍රියාවලිය සීමා කර සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා

නිපුණතා හරහා ඔවුන්ගේ පෞරුෂය ගොඩනැගෙන ලෙස ඇගයීම් ක්‍රියාවලියක් සකසනු ඇත.

viii. පාසල් ජනප්‍රිය කරන සහ යටිතල පහසුකම් වැඩිදියුණු කරන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.

ix. සෑම දරුවෙකුට ම මූලික අධ්‍යාපනය අනිවාර්යය වන අතර වයස අවුරුදු 16 න් ඉහළ සෑම දරුවකුට ම දේශයේ ඉතිහාසයේ, දේශ වාත්සල්‍යය හා වෘත්තීය පුහුණුව ලබා දීමට ක්‍රියා කරනු ඇත.

x. සියලු ගුරුවරුන් ආසියාතික දැනුමකින් සන්නද්ධ කරනු ඇත.

xi. සභ්‍යත්ව විඥානය ගොඩනගනු වස් ආසියානු දැනුම් පද්ධතිය සොයා යන උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවනු ඇත.

xii. පාසල් හා විශ්වවිද්‍යාලයීය ගුරුවරුන් ආසියාතික දැනුමේ යුක්තිකයන් කරනු ඇත.

## සෞඛ්‍යය

14.

i. සෞඛ්‍ය ක්ෂේත්‍රය සියලු සත්වයන්හට ලබා දෙන්නා වූ අමිල සේවයක් මිස වාණිජ ව්‍යාපාරයක් නොවන්නේ ය යන උතුම් සංකල්පය මත පිහිටා කටයුතු කරනු ඇත.

ii. ස්වදේශික වෙදකම සඳහා පූර්ණ අනුග්‍රහය ලබා දෙනු ඇත.

iii. සියලු පෞද්ගලික රෝහල් පූර්ණ නියාමනයකට යටත් කරනු ඇත.

iv. ජනතාවට අවශ්‍ය වන්නා වූ බෙහෙත් සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ඇත.

v. රජයේ රෝහල්ගත දෛනික බාහිර රෝගී අංශය දැනට දවසේ උදේ වරුවට පමණක් සීමා වන හෙයින් දවස පුරා බාහිර රෝගී සේවාව පවත්වාගෙන යාමට විධි විධාන සැලසනු ඇත.

vi. දිවයින පුරා සිටින සියලු ම සම්ප්‍රදායයන්ට අයත් වෛද්‍යවරුන්ට (බටහිර, ආයුර්වේද, පාරම්පරික ආදි) රජයේ ලියාපදිංචිය ලබා දී ඔවුන් නියාමනය කරනු ඇත.

## කර්මාන්ත

15.

i. පවතින ආර්ථික අර්බුද හමුවේ දේශීය කර්මාන්තකරුවා බේරා ගැනීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ඇත. ඒ යටතේ ග්‍රාමසේවා කොට්ඨාස මට්ටමින් පිහිටුවා ඇති සෑම කර්මාන්තයක් ම වෙන් වශයෙන් සලකා, ඔවුන් මුහුණ දෙන ආවේණික ප්‍රශ්න හඳුනා විසඳුම් සපයනු ඇත.

ii. මෙරට සන්නාමයන් ප්‍රචලිත කිරීමට පූර්ණ අනුග්‍රහය ලබා දෙනු ඇත.

iii. තරුණ ප්‍රජාව ව්‍යවසායකයින් ලෙස නැගී සිටීමට දිරිමත් කරනු ඇත.
iv. අප මෙතෙක් ලබා නොගත් තාක්ෂණික සහ කර්මාන්තමය අත්දැකීම් මෙරට ව්‍යාපාරිකයන්හට ලබාදීමේ උපක්‍රමික සැලසුමක් ලෙස, සීමිත කාල සීමාවකට යටත් ව මෙරට ව්‍යාපාර, ලොව ප්‍රමුඛ ව්‍යාපාර හා එක්ව කටයුතු කිරීමට අවස්ථාව සලසනු ඇත..

## ක්‍රීඩා

16.

i. සෑම ලියාපදිංචි ක්‍රීඩාවකට ම අදාළ ක්‍රීඩා සංගම් සක්‍රීය කරනු ඇත.
ii. සාමාජීය වශයෙන් ජනප්‍රිය බොහෝ ක්‍රීඩා ජාතික පිළිගැනීමක් ඇති ක්‍රීඩා බවට පත් කරනු ඇත.
iii. ජාත්‍යන්තර වර්ගීකරණයට අයත් දේශීය ක්‍රීඩකයන්හට රජයේ මැදිහත්වීම මත ආදායම් මාර්ගයක් සකස් කර දීම, රාජ්‍ය පිළිගැනීමක් ලබා දීම හා ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීම මගින් ඔවුන් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ගිලිහී යාම වළක්වනු ඇත.
iv. ක්‍රීඩාවට ලබන ජාත්‍යන්තර පදක්කම්, රජයේ පිළිගැනීමක් ඇති විශ්වවිද්‍යාලයක ක්‍රීඩා අධ්‍යාපනය සඳහා සුදුසුකමක් සේ සළකනු ඇත.
v. මෙරටට ඔලිම්පික් රන්පදක්කම් ලබාදීමේ අවුරුදු 8 ක වැඩපිළිවෙලක් සැලසුම් කරනු ඇත.
vi. සෑම කෙනෙකුට ම ව්‍යායාම ඇවිදීම සහ පාපැදි ජනප්‍රිය කර, ඊට අවශ්‍ය පහසුකම් සපයනු ඇත.

## ආර්ථිකය

**17. යටත්විජිත ආර්ථික ප්‍රතිපත්තිය අහෝසි කරනු ඇත.**
**18. සියලු ම ස්වාභාවික ජාතික ධන නිධානයන්/ සම්පත් ගවේෂණය කොට රාජ්‍ය අයිතිය යටතේ පමණක් පවත්වාගෙන යනු ඇත.**
**19. සියලු ම ආනයන අපනයන ක්‍රියාවලිය රජය සතු වනු ඇත.**
**20. සංචාරක ව්‍යාපාරය සංස්කෘතියක් සේ සුරැක, පවත්වාගෙන යනු ඇත.**
**21. දේශීය නිෂ්පාදන ව්‍යාපාර රටට ලාභදායී ලෙස ආරම්භ කොට පවත්වාගෙන යනු ඇත.**
**22. අභ්‍යන්තර වෙළඳ කටයුතු හා නිෂ්පාදන කටයුතු සමුපකාර ක්‍රමයකට පවත්වාගෙන යනු ඇත.**

## කෘෂිකර්මය

23. ආහාර බෝග
 i. රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කරනු සඳහා සියලු ප්‍රධාන ආහාර බෝග මෙරට වගා කිරීම දිරිමත් කරනු ඇත.

24. **පොහොර, කෘමි සහ වල් පාලනය, කෘෂි උපකරණ**
 i. රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතය ක්‍රමයෙන් අඩු කරනු ඇත.
 ii. පොහොර මෙරටට ගෙන ඒම ක්‍රමික ව අවසන් කරනු ඇත.
 iii. දේශීය පොහොර නිෂ්පාදනය පර්යේෂණාත්මක ව දියුණු කරනු ඇත.
 iv. කෘෂි උපකරණ දේශීය ව නිෂ්පාදනය කරනු ඇත.

25. ගොවිතැන
 i. මෙරටට ආවේණික ගොවිතැන් ක්‍රම ජනප්‍රිය කරවීම, පැරණි පෝෂ්‍යදායි සහල් වර්ග වගාවට ගොවියාට සහනදායී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම, වෙනත් පැරණි පෝෂ්‍යදායී මෙන් ම ඖෂධමය ගුණ ඇති බෝග වර්ග හඳුනාගෙන වගා කිරීමට දිරි දෙනු ඇත.
 ii. අපනයන කෘෂි නිෂ්පාදන හැකි පමණ අගය එකතු කළ නිෂ්පාදන ලෙස සකසා අපනයනය කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම, දිරි ගැන්වීම්, අදාළ නිෂ්පාදකයන්ට ලබා දෙනු ඇත.
 iii. යැපුම් ගොවිතැන තුළින් දෛනික පරිභෝජනයට අවශ්‍ය භෝග වර්ග 10 ක් සෑම ගෙවත්තක ම රෝපණය කර නඩත්තු කිරීමට රාජ්‍ය නුග්‍රහය ලබා දෙනු ඇත. (ඉඟුරු, කහ, කරපිංචා, රම්පෙ, දෙහි, මිරිස්, දඹල, කොළ වර්ගයක්, අල වර්ගයක්, ගම්මිරිස් වැනි)
 iv භෝග නිෂ්පාදනයේ අතිරික්ත භෝග සඳහා අනු නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකත්වයන් දිරිමත් කරනු ඇත. (තක්කාලිවලින් සෝස්, ජෑම්, වට්ටක්කාවලින් ජෑම්, කොස්වලින් හා වියළි කොස් මදුළු ඇටවලින් පිටි, ඉදුණු කොස් බීම, කැකිරිවලින් බීම වැනි)

26. **රටට ආර්ථික වශයෙන් අලාභ වන ගව ඝාතනය තහනම් කරනු ඇත.**
27. **සහල්, එළවළු හා වෙනත් කෘෂි නිෂ්පාදන පිළිබඳ මිල පාලනයට රජය මැදිහත් වනු ඇත.**
28. **ගංවතුර, නියඟය සහ සෝදා පාළුව වැළැක්වීම සඳහා විශාල පැළ බැවුම් සහිත කඳුකරය යළි ස්වාභාවික වනාන්තර බවට පත් කරනු ඇත.**
29. **ශාක ත්‍රස්තවාදය මුළුමනින් ම පරාජය කරනු ඇත.**
30. **එල්ලංගා පද්ධතිය සහිත වී ගොවිතැන යළි ස්ථාපිත කරනු ඇත.**
31. **මහවැලි ව්‍යාපාරය වැනි විනාශකාරී යෝජනා පිළිබඳ කොමිෂන් සභා මඟින් ප්‍රගති අධ්‍යයන සිදු කරනු ඇති අතර වාපි ජල ශිෂ්ටාචාරය ඇති**

කිරීමට කටයුතු කරනු ඇත.

## ආහාර සුරක්ෂිතතාව

32.

i. විකෘති වී ඇති ආහාර සංස්කෘතිය පුරාතන ආහාර සංස්කෘතිය අධ්‍යයනය කොට වෙනස් කරනු ඇත.

ii. පශු සම්පත් සහ ධීවර සම්පත් පිළිබඳ ප්‍රතිපත්තිමය නිර්ණායකයන් සකසනු ඇත.

iii. දේශීය දැනුම් පද්ධතිය මත ගොඩනැගෙන ආහාර සුරක්ෂිතභාව පිළිබඳ සැලසුම් සකස් කරනු ඇත.

iv. දේශීය ව නිෂ්පාදනය කළ හැකි ආහාර ආනයනය තහනම් කරනු ඇත

v. පාන් පිටි, ආනයනික කිරිපිටි, ආනයනික ටින් මාළු සහ කරවල, ආනයනික පලතුරු වර්ග සහ වෙනත් විදේශීය ආහාර වර්ග සඳහා බරපතල සීමා පනවනු ඇත.

vi. හාල්පිටි, සීනි, මී පැණි, කිතුල් පැණි, කිතුල් හකුරු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන යනාදි කර්මාන්ත සඳහා දිරි දෙනු ඇත.

vii. වෙළඳ නම් වෙනස් කරමින් නීතියෙන් රිංගා යමින්, සෞඛ්‍ය සංකූලතා සඳහා ඍජු ව බලපාන ආහාර ලෙසින් හඳුන්වන නමුත් කිසිසේත් ආහාර ලෙස සුදුසු නොවන දේ ආනයනය හෝ දේශීය නිෂ්පාදනය සහ අලෙවිය මුළුනමින් ම තහනම් කරනු ඇත.

viii. ආනයනයනික ආහාර හැකිතාක් නිෂ්පාදනය කරනු ඇත. එසේ නොහැකි නම් ආහාර ආදේශක හඳුනාගෙන නිෂ්පාදන කරනු ඇත.

## පාරිසරික සුරක්ෂිතභාවය

33.

i. විධිමත් පාරිසරික නීති පද්ධතියක් ක්‍රියාත්මක කොට ඒ යටතේ පරිසරයට මුදා හැරෙන සහ පරිසරයෙන් උකහා ගන්නා දේ සම්බන්ධ දැඩි විනයක් අනුගමනය කරනු ඇත.

ii. මධ්‍ය කඳුකරය රටේ ජල පෝෂක ප්‍රදේශය ලෙස සළකා කටයුතු කෙරේ.

iii. වසර 200 යුරෝපීය යටත් විජිත සමයේ සිට මෑතකාලීන විල්පත්තු වන විනාශය දක්වා පරිසරයට සිදු වූ අගතිය ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නොපසුබට වනු ඇත.

iv. රටේ සංවර්ධන කටයුතු සඳහා පරිසර වෙනස්කම් කිරීමේ දී හුදු පාසරික වාර්තාවලින් ඔබ්බට ගිය දේශීය පාරිසරික ක්‍රමවේද නුගමනය කෙරේ. (එනම් වැව සෑදීමේ දී එය මිනිස් ක්‍රියාකාරකමක් වුව ද පරිසරයේ ම කොටසක් බවට පත් කළ උසස් ස්වදේශික

පාරිසරික සංකල්ප අනුගමනය කිරීම ආදි...)

## බෞද්ධාගම පෝෂණය සහ ප්‍රචාරණය

34.

i. ශ්‍රී ලංකාව ලෝක ථේරවාදී බෞද්ධ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමට අවශ්‍ය යොජනා හා සුදුසුකම් සම්පූර්ණ කරනු ඇත.
ii. සෑම දිස්ත්‍රික්කයක් තුළ ම ඇති බෞද්ධ පුරාවස්තු සුරැකීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරනු ඇත.
iii. බුද්ධාගමට ප්‍රමුඛස්ථානයක් දීම යන දේශපාලනික වාක්‍යය වෙනුවට, වසර දහස් ගණනක මේ මහා ශිෂ්ටාචාරයේ බෞද්ධ සම්ප්‍රදායයන් හා සභ්‍යත්වය සඳහා වූ අයිතිය එක් බිම් අඟලක් පාසා තහවුරු කරනු ඇත.
iv. ආගමික ස්ථාන පිහිටු වීම, පොදු නියාමනයකට යටත් කරනු ඇත.
v. ආගමික වත්පිළිවෙත් සඳහා අධිකරණ බලයක් හිමි නොවනු ඇත.

## ප්‍රවාහන සේවාවන්

35.

i. පෞද්ගලික බස් සේවය ආයතනික ව්‍යූහයක් යටතට ගනු ඇත.
ii. රාජ්‍ය ප්‍රවාහනය විධිමත් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ආයතනික වෙනස්කම් සිදු කරනු ඇත.
iii. රට පුරා ක්‍රියාත්මක වන ත්‍රීරෝද රථ හා අනෙකුත් ප්‍රවාහන සේවාවන් නියාමනයකට යටත් කරනු ඇත.
iv. පොදු ප්‍රවාහන සේවයන්හි නියුක්තිකයන් විශේෂ පුහුණු වැඩමුළුවලට සහභාගී කරවා, එම සේවය උසස් මානව සේවාවක් බවට පත් කරනු ඇත.

## වෙළඳාම

36.

i. වෙළඳාම සඳහා රටේ පිහිටීම අනුව අපට හිමි සමුද්‍රීය වාසිදායක තත්ත්වය උපරිම ලෙස ප්‍රයෝජනයට ගනු ඇත.
ii. රට තුළ සිටින දේශීය ව්‍යාපාරිකයා දිරිමත් කිරීම සහ දේශීය සන්නාමයන් ජාත්‍යන්තර ලෙස ප්‍රවර්ධනයට රජයේ ඍජු දායකත්වය සපයනු ඇත.
iii. වාසිදායක වෙළඳ ගිවිසුම්වලට පමණක් එළඹීමට හා අලුත් වෙළඳපොළ සොයා ගැනීමට යෙමු වනු ඇත.

## වැව් අමාත්‍යාංශයක් පිහිටුවීම

37. වැව යනු හුදු ජලය එක්රැස් කරනා ස්ථානයක් ලෙස නොව එය සංස්කෘතියක් ලෙස සලකා. මෙරට ඇති දහස් ගණනක වැව් ජාතික සංවර්ධන හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගනු ඇත.

## රාජ්‍ය ආරක්ෂාව

38.

i. රාජ්‍ය ආරක්ෂාවට ඉහළ ම ප්‍රමුඛතාව ලබා දී ආරක්ෂක අංශ, පිරිස් බලයෙන්, පුහුණුවෙන්, අවිබලයෙන් සහ තාක්ෂණයෙන් සන්නද්ධ කරනු ඇත.

ii. මෙරට පසුගිය දශක කිහිපය තුළ සිදු වූ රටේ අභ්‍යන්තරික සහ බාහිර උවදුරු සලකා, මෙරට ආරක්ෂාවට සහ භෞමික අඛණ්ඩතාවට ඍජුව හෝ වක්‍ර ව බල පෑ හැකි සිදුවීම් නිරීක්ෂණය, අධ්‍යයනය (සහ විශ්ලේෂණය) සහ සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීමට දේශීය සහ විදේශීය වශයෙන් ක්‍රියාත්මක විය හැකි ආරක්ෂක 'ඇසක්', 'කනක්' නිර්මාණය කරනු ඇත.

## විදේශ සම්බන්ධතා සහ විදේශ කටයුතු

39.

i. යටත්විජිත ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගෙන පොදු රාජ්‍ය මණ්ඩල වැනි ආයතන හා බැඳීම නැවත සලකා බැලෙන අතර නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ඇත.

ii. කිසිදු රාජ්‍යයකට හා ජාත්‍යන්තර ආයතනයකට යටත් නොවනු ඇති අතර ඔවුන් හා සහයෝගයෙන් ක්‍රියා කරනු ඇත.

iii. තානාපති සේවය යනු කිසිවෙකු ලබන වරප්‍රසාදයක් ලෙ නොව මෙරට සියලු වටිනාකම් ලොව හමුවේ එළිදක්වන සක්‍රීය සේවාවක් ලෙස සලකා මෙරට ව්‍යාපාරිකයන්, ව්‍යාපාර සහ නිෂ්පාදන සියලු තානාපති සම්බන්ධතාවයන් පවත්වන රටවල අවශ්‍යතාවන් සමග ගලපනු ඇති අතර තනාපති සේවය වෙළඳ සබඳතාව සඳහා වැඩියෙන් භාවිත කරනු ඇත.

iv. විදේශයන් සඳහා ගෘහ සේවිකාවන් යැවීම මුළුමනින් ම නවත්වනු ඇති අතර ගෞරවණීය හා වාසිදායක වෙනත් රැකියා අවස්ථා නිර්මාණය කරනු ඇත.